ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන ... පය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Edu... ion Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ ... ාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Ga... ha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ග

**ගම්පහ අධ්‍යාපන කලාපය**
Gampaha Education Zone

**දෙවන වාර ඇගයීම - 2025**
Second Term Evaluation - 2025
இரண்டாம் தவணைப் பரீட்சை - 2025

| | | | | | |
|---|---|---|---|---|---|
| ශ්‍රේණිය Grade | 13 | විෂයය Subject | **යුරෝපා ඉතිහාසය - 25 B** | කාලය Time | පැය 03 |
| **නම** **பெயர்** **Name** | | | | | |

## I කොටස

❖ **අංක 1 සිට 10 තෙක් වූ ප්‍රශ්න වලට එක් එක් ප්‍රශ්නය සඳහා නම් පහ බැගින් දක්වා ඇත. ඒවා අතරින් එකක් පමණක් කවර හෝ හේතුවක් නිසා අනෙක් නම් සමග නොගැලපේ. එම නොගැලපෙන නම කුමක්දැයි හඳුනාගෙන එහි අංකය තිත් ඉර මත ලියන්න.**

1) 1) රිචලියු 2) මැසරින් 3) නෙකර්
4) කෝල්බෙයාර් 5) ඩැන්ටන් (........)

2) 1) ජෝන් වෛක්ලිෆ් 2)මාටින් ලූතර් 3) ජෝන් කැල්වින්
4) උල්රිච් ස්වින්ග්ලි 5) හෙන්රි හඩ්සන් (........)

3) 1) ෂොල්ෆරිනෝ 2) වෝටර්ලූ 3) ලිප්සිග්
4) ඔස්ටලිට්ස් 5) ට්‍රැෆල්ගාර් (.........)

4) 1) කෝටේස් 2) ස්ටේටස් ජනරාල් 3) සෝවියට්ස්
4) පාර්ලිමේන්තුව 5) ඩූමා (.........)

5) 1) විස්ටියුලා 2) කීල් 3) රයින්
4) ෂේන් 5) එල්බ් (.........)

6) 1) ලියනාඩෝ ඩාවින්චි 2) නිකලෝ මකියාවෙලි 3) බොට්ටිෂෙල්ලි
4) ප්‍රැන්සිස් පෙට්රාක් 5) මැසෙක්සියෝ (.........)

7) 1) නිකලස් කොපර්නිකස් 2) ජොහැන්ස් කෙප්ලර් 3) ජෝන් වෛක්ලිෆ්
4) ගැලිලියෝ ගැලිලි 5) පැරසල්සස් (........)

8) 1) බර්තලමියු දියෙස් 2) අල්බ්‍යුකර්ක් 3) ප්‍රැන්සිස්කෝ පිසරෝ
4) ඇමරිගෝ වෙස්පුචි 5) මැගලන් (.........)

9) 1) ජේම්ස් හාග්‍රිව්ස් 2) රිචඩ් ආක්රයිට් 3) ජේම්ස් වොට්
4) ඔලිවර් ක්‍රොම්වෙල් 5) තෝමස් නිව්කොමන් (.........)

10) 1) රොබට් වෝල්පෝල් 2) ඒබ්‍රහම් ලින්කන් 3) ක්ලෙමන්ට් ඇට්ලි
4) බෙන්ජමින් ඩිෂ්රයිල් 5) වින්ස්ටන් චර්චිල් (..........)

❖ **අංක 11 - 15 දක්වා දක්වා ප්‍රශ්න වල එක් මාතෘකාවක් යටතේ කරුණු 05 දක්වා ඇත. එයින් එකක් මාතෘකාවට නොගැලපේ. ඊට අදාල අංකය වරහන තුල ලියන්න**

11) ප්‍රංශ විප්ලවය
1) ස්ටේටස් ජනරල් සභාව කැඳවීම. 2) බැස්ටීලය බිඳවැටීම.
3) 16 වැනි ලුවීගේ හිසගසා දැමීම 4) දහඅට වන ලුවී රජ වීම.
5) භීම සමය (........)

12) නැපෝලියන් බොනපාට් විසින් අත්සන් කළ ගිවිසුම්
1) කැම්පොපෝමියෝ ගිවිසුම . 2) ලූනෙවිල් ගිවිසුම
3) වියානා ගිවිසුම 4) ඒමියන්ස් ගිවිසුම
5) ටිල්ෂිට් ගිවිසුම (........)

13) කාර්මික විප්ලවය,
1. එංගලන්තයේ ආරම්භ වීම 2. කර්මාන්ත ක්‍රමය වර්ධනය වීම.
3. කම්කරු පන්තියේ නැගී ඒම 4. පුද්ගලික ව්‍යවසාය වර්ධනය වීම.
5. පරිසර සංරක්ෂණය කිරීම. (........)

14) එංගලන්තයේ පාර්ලිමේන්තුවේ වර්ධනය
1) 1215 මහා අධිකාරි පත්‍රය අත්සන් කිරීම.
2) 1628 දී I චාල්ස් අයිතිවාසිකම පිළිබඳ පෙත්සම පිළිගැනීම.
3) 1689 අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශය
4) 1776 ඇමරිකාවේ යටත් විජිත නිදහස ප්‍රකාශ කිරීම.
5) 1867 ප්‍රතිසංස්කරණ පනත සම්මත කිරීම. (.........)

15) පළමුවන ලෝක යුද්ධය
1. යුරෝපීය රටවල සතුරු කඳවුරු දෙකකට බෙදී යාම.
2. ඔස්ට්‍රියාව ඔටුන්න හිමි කුමරු ඝාතනය ආසන්නතම සිදුවීමයි.
3. ප්‍රතිඵල ලෙස අළුත් රාජ්‍යයන් කිහිපයක් බිහි විය.
4. යුද්ධයෙන් පසු ලෝක සාමය ආරක්ෂා කිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය බිහි වීම.
5. යුද්ධයෙන් ජර්මනිය පරාජය වීම. (.........)

❖ **නොගැළපෙන කරුණ ඇතුලත් වරණයේ අංකය වරහන් තුල ලියන්න.**

16) 1) පිරනීස් කඳුවැටිය 2) ඩැනියුබ් ගඟ 3) කොන්ස්තන්තිනෝපලය
4) බෝලාන් දුර්ගය 5) පෝලන්ත කපොල්ල (........)

17) 1) ජෝන් ලොක් 2) ජීන් ජැක්වින් රූසෝ 3) ඇඩම් ස්මිත්
4) මොන්ටෙස්කියු 5) වෝල්ටෙයාර් (........)

18) 1) අයිලා චැපෙල් 2) ට්‍රෙන්ට් 3) ලයිබැක්
4) ට්‍රොපොව් 5) වෙරෝනා (........)

19) 1) හිට්ලර් 2) මුසෝලිනි 3) රූස්වෙල්ට්
4) නෙවිල් චෙම්බර්ලේන් 5) ස්ටාලින් (.........)

20) 1) නීතියේ සාරය 2) ලෙවියතන් 3) සමාජ සම්මුතිය
4) දාස් කැපිටාල් 5) මෙන්ෂෙවික් (........)

❖ **21 - 25 දක්වා වූ ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමට පෙර පහත දී ඇති උපදෙස් සම්පිණ්ඩනය කියවා අදාල අංකය වරහන් තුල ලියන්න.**

A සහ B පමණක් නිවැරදි නම් 1
B සහ C පමණක් නිවැරදි නම් 2
C සහ D පමණක් නිවැරදි නම් 3
D සහ E පමණක් නිවැරදි නම් 4
ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි නම් 5 ද වරහන් තුල ලියන්න.

21) කාර්මික විප්ලවයේ ප්‍රතිඵල
A. කෘෂිකර්මය දියුණු වීම. B. පරිසරය ආරක්ෂා වීම
C. නාගරීකරණය D. මහා පරිමාණ නිෂ්පාදන
E. ඉඩම් හිමි ප්‍රභූ පන්තියේ වර්ධනය (.........)

22) ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයට තුඩුදුන් හේතු සාධක
A. පාප් වහන්සේ සහ පූජකවරු අතර මතභේද B. මාටින් ලූතර්ගේ නායකත්වය
C. කතෝලික සභාවේ පැවති දූෂණ D. පූර්ණ ඵල පත්‍රිකා විකිණීම.
E. තිස් අවුරුදු යුද්ධය (.........)

23) ප්‍රංශ විප්ලවයට සම්බන්ධ පුද්ගලයන් වන්නේ,
A. III ජෝර්ජ් B. මිරාබෝ C. නැපෝලියන් බොනපාට්
D. II චාල්ස් E. VII වන හෙන්රි (.........)

24) පළමු ලෝක යුද්ධයේ ප්‍රතිඵල වන්නේ,
A. වියානා මතය B. බොල්ෂෙවික් විප්ලවය
C. අධිරාජ්‍යවාදයේ වර්ධනය D. වර්ෂෙල්ස් ගිවිසුම
E. ජාතීන්ගේ සංගමය බිහිවීම. (.........)

25) නව රාජාණ්ඩු ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ වන්නේ,
A. බලතල සංකේන්ද්‍රගත කිරීම. B. පල්ලියේ බලය වර්ධනය වීම.
C. රදල පන්තියේ බලය දුර්වල වීම. D. ස්ථාවර යුද්ධ හමුදාව
E. ප්‍රවේණි ක්‍රමය වර්ධනය වීම. (........)

❖ **X හා Y තීරු වල සංයෝග ගලපා නිවැරදි සංයෝගයට අදාළ අංකය වරහන් තුල ලියන්න.**

| | X | Y |
|---|---|---|
| 26) | (i) වැඩවසම් ක්‍රමය | A. ධර්මාධිකරණය |
| | (ii) ශාස්ත්‍රීය පුනරුදය | B. බලය සංකේන්ද්‍රගත වීම. |
| | (iii) නව රාජාණ්ඩුව | C. ස්වභාවිකත්වයට නැඹුරු වීම. |
| | (iv) ප්‍රතිරෙපරමාදූ | D. ප්‍රවේණි ක්‍රමය |
| | (v) කාර්මික විප්ලවය | E. අධිරාජ්‍යවාදය |

1) DCBAE 2) DCABE 3) DEBAC 4) DABCE 5) DBACE (.........)

| | X | Y |
|---|---|---|
| 27) | (i) වොල්ගා ගග | A. කළු මුහුද |

(ii) ඩැනියුබ් ගඟ — B. බෝල්ටික් මුහුද
(iii) තේම්ස් ගඟ — C. උතුරු මුහුද
(iv) එල්බ් ගඟ — D. ඉංග්‍රිසි ඕඩය
(v) ඕඩර් ගඟ — E. කැස්පියන් මුහුද

1) CBDEA 2) CABED 3) CDEAB 4) CEABD 5) CBDAE (........)

| | X | Y |
|---|---|---|
| 28) | (i) IV වැනි හෙන්රි | A. රුසියාව |
| | (ii) ෆෙඩ්රික් විලියම් | B. ප්‍රශියාව |
| | (iii) I වැනි ජේම්ස් | C. පීඩ්මොන්ට් |
| | (iv) II වැනි නිකලස් | D. එංගලන්තය |
| | (v) චාල්ස් ඇල්බට් | E. ප්‍රංශය |

1) EACDB 2) EDACB 3) EBDAC 4) ECBDA 5) EDCAB (........)

| | X | Y |
|---|---|---|
| 29) | (i) සැවොයි | A. හොල්ස්ටයින් |
| | (ii) ඇල්සාස් | B. නීස් |
| | (iii) සාර්ඩීනියා | C. බැග්ඩැඩ් |
| | (iv) ෂෙල්ස්විග් | D. පීඩ්මොන්ට් |
| | (v) බර්ලින් | E. ලෝරේන් |

1) BEDAC 2) BDACE 3) BCDAE 4) BDCEA 5) BAECD (........)

| | X | Y |
|---|---|---|
| 30) | (i) ප්‍රංශය | A. වස්කෝ ද ගාමා |
| | (ii) ඕලන්දය | B. ක්‍රිස්ටෝපර් කොලම්බස් |
| | (iii) පෘතුගාලය | C. ජෝන් කැබෝ |
| | (iv) ස්පාඤ්ඤය | D. ජැක්විෂ් කාටියර් |
| | (v) එංගලන්තය | E. හෙන්රි හඩ්සන් |

1) DACBE 2) DEACB 3) DAECB 4) DEABC 5) DBACE (.........)

| | X | Y |
|---|---|---|
| 31) | (i) මුසෝලිනී | A. නව රතු හමුදාව |
| | (ii) මැසිනි | B. ලේ සහ යකඩ |
| | (iii) ගැරිබෝල්ඩ් | C. රතු කමිස හමුදාව |
| | (iv) බිස්මාර්ක් | D.තරුණ ඉතාලිය |
| | (v) ලෙනින් | E. කලු කමිස හමුදාව |

1) ECBAD 2) EBADC 3) EDCBA 4) EADBC 5) EDACB (.........)

| | X | Y |
|---|---|---|
| 32) | (i) දෙවන පිලිප් | A. ඕස්ට්‍රියාව |
| | (ii) හතරවැනි හෙන්රි | B. ස්පාඤ්ඤය |
| | (iii) මරියා තෙරේසා | C. රුසියාව |
| | (iv) දෙවැනි නිකලස් | D. පීඩ්මොන්ට් සහ සාර්ඩිනියා |
| | (v) වික්ටර් ඉමානුවෙල් | E. ප්‍රංශය |

1) BACED  2) BDACE  3) BEACD  4) BCDEA  5) BAECD  (........)

| | X | Y |
|---|---|---|
| 33) | (i) වෙස්ට්ෆේලියා සාම ගිවිසුම | A. 1713 |
| | (ii) යුට්රෙට් සාම ගිවිසුම | B. 1829 |
| | (iii) ඇඩ්‍රියානෝපල් ගිවිසුම | C. 1919 |
| | (iv) විලාෆ්‍රැන්කා ගිවිසුම | D. 1648 |
| | (v) වර්ෂෙල්ස් ගිවිසුම | E. 1859 |

1) DBECA  2) DABEC  3) DEACE  4) DCAEB  5) DBACE  (........)

| | X | Y |
|---|---|---|
| 34) | (i) තිස් අවුරුදු යුද්ධය | A. II ඇලෙක්සැන්ඩර් |
| | (ii) සත් අවුරුදු යුද්ධය | B. නැපෝලියන් බොනපාට් |
| | (iii) වෝටර් ලූ සටන | C. ගුස්ටාවුස් ඇඩොල්ෆ්ස් |
| | (iv) ක්‍රිමියන් යුද්ධය | D. XV වන ලුවී |
| | (v) සොල්ෆරිනෝ සටන | E. III නැපෝලියන් |

1) CDBAE  2) CBAED  3) CAEBD  4) CDAEB  5) CADBE  (.........)

| | | |
|---|---|---|
| 35) | (i) තෝමස් නිව්කොමන් | A. ස්පිනිං ජේනි |
| | (ii) ජේම්ස් හාග්‍රීව්ස් | B. විදුලි බලය |
| | (iii) විලියම් ගිල්වර්ට් | C. වාෂ්ප එන්ජිම |
| | (iv) මාර්කෝනි | D දුරකථනය |
| | (v) ග්‍රැහැම්බෙල් | E. ගුවන් විදුලිය |

1) CBDEA  2) CABED  3) CDEAB  4) CEADB  5) CBDAE  (.........)

❖ **36 - 40 දක්වා පහත වූ වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.**

| | **පළමුවන වගන්තිය** | **දෙවන වගන්තිය** |
|---|---|---|
| (1) | නිවැරදිය | වැරදිය |
| (2) | නිවැරදිය | නිවැරදිය |
| (3) | වැරදිය | වැරදිය |
| (4) | වැරදිය | නිවැරදිය |
| (5) | නිවැරදිය | නිවැරදි අතර පළමු ප්‍රකාශය විස්තර කරයි. |

| **පළමුවන වගන්තිය** | **දෙවන වගන්තිය** | |
|---|---|---|
| 36. ප්‍රංශ විප්ලවයට හේතුව ආදී තන්ත්‍රයේ දුර්වලතාය. | නැපෝලියන් බලයට පත් කිරීමේ අරමුණෙන් ජනතාව කැරලි ඇති කළහ. | |

| | | |
|---|---|---|
| | | (...........) |
| 37. මෙටර්නික් විප්ලවවාදී මූලධර්ම ආරක්ෂා කිරීමට දැඩිව වෙහෙසුනු ප්‍රගතිශීලී පාලකයෙකි. | 19 වන සියවස අග භාගයේ බිස්මාර්ක් ප්‍රංශය තනි කිරීමට රුසියාව හා ඔස්ට්‍රියාව සමග මිතුරු විය. | (...........) |
| 38. රුසියාව තුර්කි අධිරාජයාව ආරක්ෂා කරමින් නැගෙනහිර යුරෝපා ප්‍රශ්නයේ දී කටයුතු කළේය. | එංගලන්තය බෝල්කන් ප්‍රදේශයට ව්‍යාප්ත කිරීමෙන් තුර්කිඅධිරාජ්‍යය බිඳ දැමීමට කටයුතු කළේය. | (...........) |
| 39. I වන ලෝක යුද්ධයේ දී ජර්මනිය හා ප්‍රංශය එක් පිළක සිටියහ. | යුද්ධය අවසානයේ වර්සෙල්ස් ගිවිසුමෙන් ජර්මබසයට දඩුවම් දෙන ලදි. | (...........) |
| 40. ප්‍රංශය 17 වන සියවසේ දී යුරෝපයේ බලවතා විය. | I එලිසබෙත් රජින 'ඉන්ටෙන්ඩාන්ට් යනුවෙන් නිලධාරින් පත් කළාය. | (...........) |

## II කොටස

- **පලමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **B හා Cකොටස්වලින් අවම වශයෙන් <u>එක් ප්‍රශ්නය</u> බැගින් තෝරාගෙන තවත් ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.**

Þ

### A කොටස

1- **ඔබට සපයා ඇති යුරෝපා සිතියමේ පහත සඳහන් සියලුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

| | |
|---|---|
| 1- ජිබ්‍රොල්ටාර් සමුද්‍ර සන්ධිය | 2- ස්වීඩනය |
| 3- ඩැනියුබ් ගඟ | 4- ඩැන්සිග් |
| 5- රෝමය | 6- ඊජියන් මුහුද |
| 7- කෝෂිකා දූපත | 8- පැරිස් |
| 9- පිරනීස් කඳු | 10 ලන්ඩන් |
| 11- ලිස්බන් | 12 ඇතැන්ස් |

### B කොටස

2) ග්‍රීක සංස්කෘතියේ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න. (ල.16)

3) **"පුනරුදය යනු මධ්‍යතන යුරෝපය නූතන යුරෝපය බවට පරිවර්තනය කළ ප්‍රධාන සාධකයයි"**

අ. පුනරුදය ආරම්භ වූ රට නම් කරන්න (ල.01)

ආ. යුරෝපයේ පුනරුදය යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැ යි අර්ථ දක්වන්න. (ල.02)

ඇ.පුනරුදය ඇති වීමට තුඩුදුන් සාධක කවරේද? (ල.03)

ඈ. කලාත්මක හා විද්‍යාත්මක ක්ෂේත්‍රයන්හි පුනරුදයේ ප්‍රතිඵල ඇසුරින් ඉහත ප්‍රකාශය විචාරාත්මකව විමසන්න. (ල.10)

04) අ. ඇමරිකන් නිදහස් සටන ඇතිවීමට තුඩුදුන් හේතු විචාරාත්මකව විමසන්න. (ල.10)

ආ. ඇමරිකන් නිදහස් සටනෙන් උද්ගත වූ ප්‍රතිඵල පරීක්ෂා කරන්න. (ල. 06)

05) පහත දැක්වෙන මාතෘකා අතුරින් 02 ක් සඳහා කෙටි සටහන් ලියන්න

අ. ග්‍රීක ශිෂ්ටාචාරයේ පාලන ක්‍රම

ඇ. ස්පාඤ්ඤය යටතේ සිදු වූ දේශ ගවේෂණ කටයුතු

ඇ. එංගලන්තය ජාතික රාජ්‍යයක් ලෙස නැගීම

ඈ. ප්‍රංශ විප්ලවයේ ප්‍රතිඵල (එක් කොටසකට ල.08 බැගිනි)

## <u>C කොටස</u>

6) **"නැපෝලියන් බොනපාට් ප්‍රංශ විප්ලවයේ කාර්ය සිද්ධීන් බොහොමයක් ඉදිරියට ගෙන ගියේය"**

අ. නැපෝලියන් බොනපාට් උපන් දිවයින නම් කරන්න. (ල.01)

ආ. 1796 දී හා 1797 දී ඔහුගේ නායකත්වය යටතේ ආක්‍රමණය කරන ලද රටවල් 02 නම් කරන්න (ල.02)

ඇ.ඔහු ප්‍රංශයේ බලය අත්පත් කරගත් ආකාරය සැකෙවින් දක්වන්න. (ල. 04)

ඈ. නැපෝලියන් බොනපාට් විසින් ප්‍රංශ විප්ලවයේ කාර්ය සිද්ධීන් කෙතෙක් දුරට ඉදිරියට ගෙන යන ලද්දේ දැයි ඔහුගේ දේශීය ප්‍රතිපත්තිය ඇසුරෙන් විමසන්න. (ල.09)

7) අ. 1815 සිට 1848 දක්වා ජර්මනිය එක්සත් කිරීමට එරෙහිව පැවති ප්‍රධාන බාධක ගෙනහැර දක්වන්න. (ල.08))

ආ. 1862 සිට 1871 දක්වා ජර්මනිය එක්සේසත් කිරීමට බිස්මාක් අනුගමනය කළ ක්‍රියාමාර්ගය විවේචනාත්මකව විමසන්න. (ල. 08)

8) පළමු ලෝක යුද්ධයට බලපෑ හේතු විචාරාත්මකව විමසන්න (ල.16)

9) පහත දැක්වෙන ඔබ කැමති **<u>මාතෘකා දෙකකට</u>** කෙටි සටහන් ලියන්න

1- යුරෝපා සම්මේලන ක්‍රමය

2- 1848 විප්ලව

3- බොල්ෂෙවික් විප්ලවය

4- ජාතීන්ගේ සංගමය (ල. 08 බැගිනි)